මහනුවර යන දිස්ත්‍රික්කයන්ට අයත් තෝරාගත් ගොවි කාන්තා සමිති 50න් අහඹු ලෙස තෝරා ගනු ලැබූ ගොවි කාන්තාවන් 325 දෙනෙකු සමීක්ෂණයට ලක් කළ අතර මෙයට අදාළ නිලධාරීන් හා කෙරුණු සාකච්ඡා මගින් ද දත්ත හා තොරතුරු සපයා ගන්නා ලදී.

අධ්‍යයනයේ ප්‍රධාන සොයා ගැනීම් අනුව, ගොවි කාන්තා සමිතිවල වැඩි සාමාජික සංඛ්‍යාවක් (54%) වයස අවුරුදු 30-50 අතර වයස් කාණ්ඩයටත් 7%ක් අවුරුදු 30 ට අඩු තරුණ කණ්ඩායමටත් අයත් වූ 45%ක් සාමාන්‍ය පෙළ සමතුන් වූ හා 28%ක් උසස් පෙළ සමත් වූවෝ වෙති. සමිති හරහා විවිධ විෂයයන් යටතේ කාන්තාවන්ට පුහුණු වීම් ලබා දී ඇති අතර ඔවුන් අතරින් 72% ගේම ජනප්‍රිය පුහුණු ක්ෂේත්‍රය, ආහාර නිෂ්පාදනය පිළිබඳ වූ පුහුණුවයි. නවීන ව්‍යවසායකත්ව ක්‍රියාවන් පිළිබඳව පුහුණුව ලැබීමේ අවශ්‍යතාව 95%කට පැවතිණි. අධ්‍යයනයට සහභාගී වූ සමස්ත කාන්තාවන්ගෙන් සමිතිය හරහා 44%ක් ස්වයං රැකියාවන් හි නියුක්ත වෙති. එයින් 27%ක් ආහාර සකස් කර අලෙවි කිරීමේ කර්මාන්තයේ ද 17%ක් මල් හා විසිතුරු පත්‍ර වගාව හා අලෙවියේ ද නියැළෙති. ආහාර සකස් කර අලෙවි කිරීම ඒ සඳහා වැඩි නැඹුරුවක් දැක්වීමට හේතු වී ඇත්තේ, පවුල හා සමාජය තුළ කාන්තාවන්ගේ තෙවැදෑරුම් කාර්යභාරයට

## සංක්ෂිප්තය

සමාජයේ කුඩාම ඒකකය වන පවුල ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීම හරහා රටේ සමස්ත සමාජ- ආර්ථික හා මානව සංවර්ධනය ඉහළ නැංවීමත්, ග්‍රාමීය අංශය තුළ සුලභව පවතින කාන්තා ශ්‍රමය ආර්ථිකමය වශයෙන් සක්‍රීය කිරීමේ කාර්යය සඳහාත් වර්තමාන රාජ්‍ය අංශයේ වැඩි නැඹුරුවක් පවතී. අතීතයේ පටන්ම ශ්‍රී ලාංකීය කාන්තාව ගෘහස්ථ පරිපාලනය හා ආදායම් ඉපැයීමේ කාර්යය සමබරව පවත්වා ගනිමින් පවුල තුළ ආර්ථික හා සමාජීය සහජීවනය පවත්වා ගැනීමට ප්‍රබල දායකත්වයක් සපයන අතර කෘෂිකාර්මික කාර්යයන්හි දී ද ඉදිරියෙන් සිටී.

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්තිය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු අංශය මගින් 1970 දශකයේ පටන් වර්තමානය දක්වා ක්‍රියාත්මක කෙරෙන විශේෂ වැඩසටහනක් වන කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනෙහි වර්තමාන ක්‍රියාකාරීත්වය සහ එහි සාමාජික කාන්තාවන් තිරසාර ව්‍යවසායකයින් ලෙසත් සමාජීය වශයෙනුත් බලගැන්වීමට දක්වන දායකත්වය පිළිබඳවත් එම වැඩසටහන තවදුරටත් දියුණු කිරීම කෙසේ සිදු විය යුතු ද යන්න පිළිබඳව සොයා බැලීමේ පුළුල් අරමුණින් 2014 වර්ෂයේ දී මෙම කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන විධිමත් ඇගයීමකට ලක් කරන ලදී.

අධ්‍යයනය සඳහා තොරතුරු සපයා ගැනීමට කුරුණෑගල, මොණරාගල, අනුරාධපුරය සහ

හානි නොවන පරිදි අලෙවි ගැටලුවලින් තොරව, අමුද්‍රව්‍ය සපයාගැනීමේ දුෂ්කරතාවන්ගෙන් තොරව හා පවුලේ ශ්‍රමය භාවිතයෙන් කළ හැකි උචිතම ස්වයං රැකියාවන් ලෙස එය හඳුනාගෙන තිබීමත් කාන්තාවන්ගේ සාමාන්‍ය ජීවන රටාවට එම කාර්යය වඩාත් හුරුපුරුදු භාවයෙන් යුක්තවීම නිසාත් ය. ඔවුන්ගෙන් 70%කගේ ම මුළු මාසික ආදායම රු.10,000 හෝ ඊට අඩු වන නමුත් එය පවුලේ ප්‍රධාන ආදායමට ඉහළ දායකත්වයක් සපයන බවත් පවුලේ ප්‍රවර්ධනය හා සහජීවනය ඒ හරහා තීව්‍ර වන බවත් හෙළි විය.

අනාවරණිත කරුණු අනුව පෙනීයන්නේ, ග්‍රාමීය ප්‍රදේශයන්හි කාන්තාවන්ට ආදායම් උත්පාදන කාර්යයන්හි වඩාත් සාර්ථකව නියැළීමට මෙන් ම සමාජීය වශයෙන් බලගැන්වීමට ඉහළ පිටිවහලක් සැපයීමට ඔවුන් වෙත සමීප විය හැකි උචිත ප්‍රවේශයක් ලෙසින් එම වැඩසටහන් වැදගත් වන අතර ග්‍රාමීය අංශය තුළ සුලභව පවතින කාන්තා හා තරුණ ශ්‍රමය හඳුනාගැනීමටත් ප්‍රදේශයට සුදුසු ස්වයං රැකියා නිර්ණය කිරීමටත් ඒ සඳහා අවශ්‍ය නව පුහුණු වැඩසටහන් හා ණය වැඩසටහන් සැලසුම් කිරීමටත් මෙම වැඩසටහන් උපයෝගී කරගත හැකි බවය.

ඒ අනුව අධ්‍යයනය නිර්දේශ කරනු ලබන්නේ, ග්‍රාමීය මට්ටමේ දී දියත් කෙරෙන සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා හැකි සෑම අවස්ථාවකදී ම ගොවි කාන්තා සමිති සහභාගීත්වය ලබාගැනීමට කටයුතු කිරීමත් එම සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් හරහා රජය විසින් ලබා දෙන ප්‍රතිපාදන (පුහුණුව, ණය ආධාර, ද්‍රව්‍යාධාර) වලින් යම් ප්‍රතිශතයක් (අවම ලෙස 5%ක් වත්) කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනට අයත් ගොවි කාන්තා සමිති සාමාජිකාවන්ට ලබා දීමට කටයුතු කිරීමත්, කාන්තාවන්ට සුදුසු හා උචිත ස්වයං රැකියා ප්‍රවර්ධනයට මෙන් ම තරුණ දායකත්වය ඉහළ නැංවීමට (මල් හා විසිතුරු පත්‍ර වගාව, කොම්පෝස්ට් නිෂ්පාදනය හා අලෙවිය, ගෙවතු වගාව) පුහුණුවීම (දැනුම් පමණක් පදනම් කර නොගත් හා ප්‍රායෝගිකව යොදාගත හැකි) හා අඩු පොළී ණය ආධාර ලබා දීම සමිති හරහා වීධිමත් ක්‍රමවේදයකට ක්‍රියාත්මක කිරීමත් මේ සඳහා වර්තමානයේ ක්‍රියාත්මක වන කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින ගොවි භාරකාර අරමුදලේ ඇති මුදල් 2%ක් වැනි අඩු පොළියට ගොවීන්ට ණය සැපයීම සඳහා ගොවි බැංකු වෙත ලබා දීමේ ක්‍රමවේදය වැනි ක්‍රමවේදයක් කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සංවිධාන සඳහා ද ක්‍රියාත්මක කිරීමේ හැකියාව සොයා බැලීමත් ය. එසේම කාන්තාව ව්‍යවසායිකාවක් කළ හැකි මට්ටමේ පුහුණුවීම් සකස් කිරීමටත්, ව්‍යවසායිකාවන් පිළිබඳ පසු විමර්ශනය, දිරිගැන්වීම හා ඔවුන් රැකබලා ගැනීමටත් ඒ සඳහාම වෙන් වූ පර්යේෂණ හා සංවර්ධන ඒකයක් ස්ථාපිත කිරීමත් කළ යුතු බවයි.